**මහ කොළඹ අපජල කළමනාකරණ ව්‍යාපෘතිය - 2017**

**-----------------------------------------------------------------------**

මහ කොළඹ අපජල කළමනාකරණ ව්‍යාපෘතියේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ආසියානු සංවර්ධන බැංකුව අතර 2009 දෙසැම්බර් 18 දින එළඹි අංක 2557 දරන ණය ගිවිසුමේ 5 උපලේඛනයේ 27 වගන්තිය හා අංක 2558 දරන ණය ගිවිසුමේ 5 උපලේඛනයේ 27 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

**1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය**

**-------------------------------------------------------------**

ව්‍යාපෘතියේ ණය ගිවිසුම් අනුව, එවකට පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය වර්තමානයේ පළාත් සභා, පළාත් පාලන හා ක්‍රීඩා අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර කොළඹ මහා නගර සභාව හා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වේ. ව්‍යාපෘතියේ අරමුණු වන්නේ වැඩිදියුණු කළ මුහුදු හා රට මැද ජල තත්ත්වය මඟින් මහ කොළඹ ප්‍රදේශයේ නාගරික සහ උප නාගරික නිවැසියන් සඳහා නාගරික පරිසරය හා මහජන සෞඛ්‍ය වැඩිදියුණු කිරීම සහ එහි ප්‍රතිඵලයක් ලෙස සෞඛ්‍ය හා සනීපාරක්ෂක තත්ත්වයන් වැඩිදියුණු කිරීමයි. ණය ගිවිසුම් අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 12.597.11 කට සමාන එ.ජ.ඩො.මිලියන 110.24 ක් වන අතර, ඉන් රු.මිලියන 10,783.65 කට සමාන එ.ජ.ඩො මිලියන 94.37 ක් මූල්‍යයනය කිරීමට ආසියානු සංවර්ධන බැංකුව එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2010 අප්‍රේල් 09 දින ආරම්භ කළ අතර 2014 දෙසැම්බර් 31 දින වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේවෙතත්, ව්‍යාපෘතියේ කාලපරිච්ඡේදය 2019 මාර්තු 31 දක්වා දීර්ඝ කර තිබුණි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

**---------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වන අතර වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක, සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.4 විගණකගේ වගකීම**

**--------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක, සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේ ද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල

සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සළකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම් ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේ ද යන බව,

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමග සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඇ) ශ්‍රී ලංකා රජය හා ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණයවලින් කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේ ද යන බව.

(ඈ) ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යනු ලබන පොත්පත් හා වාර්තාවල විශේෂ ඩොලර් ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂයන්, ආපසු ගැනීම් හා එම ගිණුමට ප්‍රතිපූර්ණය කිරීම් සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව සහ 2017 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳ තිබුණු බව.

(ඉ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුම්වල දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේ ද යන බව.

(ඊ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය සහ උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේ ද යන බව.

(උ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම නිවැරදිව හඳුනාගෙන තිබුණේ ද යන බව.

(ඌ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේ ද යන බව.

(එ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේ ද යන බව, සහ

(ඒ) ණය ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේ ද යන බව.

**2. මූල්‍ය ප්‍රකාශන**

**----------------**

**2.1 මතය**

**-------**

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මා දරන්නාවූ මතය වනුයේ,

(අ) 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2017 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යනු ලබන පොත්පත් හා වාර්තාවල විශේෂ ඩොලර් ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂයන්, ආපසු ගැනීම් හා එම ගිණුමට ප්‍රතිපූර්ණය කිරීම් සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව සහ 2017 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණු බව,

(ඈ) ණය ගිවිසුම්වල දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූරණයන් සඳහා වූ ඉල්ලුම් පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඉ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක පියවරක් ගෙන තිබුණු බව, සහ

(ඊ) ණය ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්වීම

### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ව්‍යාපෘතිය විසින් ව්‍යාපෘතියේ සිවිල් කොන්ත්‍රාත් කටයුතු වල යෙදෙන කොන්ත්‍රාත්කරුවන් මඟින් මිලදී ගන්නා ලද එකතුව රු.මිලියන 26.32 ක මෝටර් වාහන 04 ක පිරිවැය අදාල වත්කම්වල ස්වභාවය සහ විවිධ ඵලදායී ජීවිත කාල සැලකීමෙන් තොරව සිවිල් වැඩ යටතේ දක්වා තිබුණි.

(ආ) වර්ගීකරණ දෝෂයක් හේතුවෙන් එකතුව රු.මිලියන 6.33 ක ගොඩනැඟිලි අළුත්වැඩියා කිරීමේ පිරිවැය යන්ත්‍ර සහ උපකරණ යටතේ වැරදි ලෙස දක්වා තිබුණි.

### 2.2.2 නීති, රීති සහ රෙගුලාසිවලට අනුකූල නොවීම්

සමාලෝචිත වර්ෂය සඳහා දේපල, පිරියත හා උපකරණවල භාණ්ඩ සමීක්ෂණ වාර්තා 2018 මැයි 08 දින ඉදිරිපත් කර තිබුණු අතර එහි ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල සඳහන් එකතුව රු.මිලියන 615.68 ක එම වත්කම්වල වටිනාකම ඒ සඳහා කරන ලද නිර්දේශවලට අනුව ගැලපුම් කර නොතිබුණි.

## 3. මූල්‍ය හා භෞතික කාර්යය සාධනය

---------------------------------------

### 3.1 අරමුදල් උපයෝජනය

-------------------------

මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ප්‍රතිපාදන සහ සමාලෝචිත වර්ෂය තුළ සහ 2017 දෙසැම්බර් 31 දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යාලේඛන කීපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුම්වල මූල්‍යයනය සඳහා එකඟ වූ මුදල | | 2017 වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරන ලද ප්‍රතිපාදනය | අරමුදල් උපයෝජනය | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | 2017 වර්ෂය තුළ | | 2017 දෙසැම්බර් 31 දිනට | |
| | එ.ජ.ඩො මිලියන | රු. මිලියන | රු. මිලියන | එ.ජ.ඩො මිලියන | රු. මිලියන | එ.ජ.ඩො මිලියන | රු. මිලියන |
| ආසබැ | 94.37 | 10,783.65 | 2,905.00 | 9.51 | 1,455.00 | 51.51 | 7,081.75 |
| ශ්‍රීලංර | 15.87 | 1,813.46 | 475.00 | 2.18 | 334.00 | 8.12 | 1,139.10 |
| එකතුව | **110.24** | **12,597.11** | **3,380.00** | **11.69** | **1,789.00** | **59.63** | **8,220.85** |

ඉහත සඳහන් තොරතුරු අනුව, ව්‍යාපෘති ක්‍රියාකාරකම් ආරම්භ වී වර්ෂ 7 ½ ඉක්මවා තිබියදීත් රු.මිලියන 12,597.11 කට සමාන එ.ජ.ඩො. මිලියන 110.24 ක මුළු වෙන්කිරීමෙන් 2017 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 8,220.85 කට සමාන එ.ජ.ඩො. මිලියන 59.63 ක් පමණක් උපයෝජනය තිබුණු බව අනාවරණය විය. කෙසේවෙතත්, ව්‍යාපෘතිය ක්‍රියාකාරකම් ආරම්භයේ සිට විස්තරාත්මක ක්‍රියාත්මක කිරීමේ සැලැස්මක් නොතිබීම නිසා මාස 15 ක ඉතිරි කාලපරිච්ඡේදය තුළදී ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් සඳහා සමස්ථ අරමුදල් ප්‍රතිපාදනය උපයෝජනය කිරීමේ හැකියාව අඩුවේ. ව්‍යාපෘති අධ්‍යක්ෂගේ පැහැදිළි කිරීම් අනුව, වරාය නගර ව්‍යාපෘතිය, කොළඹ මධ්‍යම ව්‍යාපාරික දිස්ත්‍රික්ක, සහ ජල සංවර්ධන කටයුතු වැනි විශාල ව්‍යාපෘති හඳුන්වාදීම හේතුවෙන් කොළඹ නගර සංවර්ධන සැලැස්ම පසුව වෙනස්වී තිබුණු අතර එහි ප්‍රතිඵලයක් ලෙස අපජලය කළමනාකරණ ව්‍යාපෘති ප්‍රමාදවී තිබෙන අතර අවසන් කිරීමට අපහසු වී ඇති බවය.

### 3.2 භෞතික ප්‍රගතිය

--------------------

මහ කොළඹ ප්‍රදේශය තුළ අභ්‍යන්තර ජලයේ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීමේ අරමුණ සඳහා මල නාලිකා යටිතල පහසුකම් ධාරිතාවය බලගැන්වීම, ආයතනික සහ මෙහෙයුම් ධාරිතාවය බලගැන්වීම සහ ව්‍යාපෘති කළමනාකරණය හා ක්‍රියාවට නැංවීමට සහයවීම යනාදී ප්‍රධාන සංරචක 03 යටතේ ව්‍යාපෘතියේ කටයුතු ක්‍රියාත්මක කර තිබුණි. 2016 දෙසැම්බර් 31 දින වන විටත් මළ නාලිකා යටිතල පහසුකම් යාවත්කාලීන කිරීමේ සංරචකය යටතේ මළ නාලිකා පිරිසිදු කිරීමේ උපකරණ සහ මෙහෙයුම් හා නඩත්තු උපකරණ සැපයීමේ කටයුතු අවසන් කර තිබුණු අතර කොන්ත්‍රාත්කරුට ප්‍රමාණවත් පරිදි මානව සහ භෞතික සම්පත් යෙදවීමට අපොහොසත්වීම හේතුවෙන්, කිලෝමීටර් 10 ක අපජල නළ අළුත්වැඩියාව සහ කිලෝමීටර් 125 ක අපජල නළවල තත්ත්වය තක්සේරු කිරීම යටතේ කටයුතුවල භෞතික ප්‍රගතිය අඩු මට්ටමක පැවතුණි. තවද, කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමේ ප්‍රමාදයන් සහ කොන්ත්‍රාත්කරුගේ නිර්මාණය කිරීමේ ධාරිතාවය ප්‍රමාණවත් නොවීම හේතුවෙන්, 2017 දෙසැම්බර් 31 දිනට අළුත්වැඩියා කටයුතු සඳහා පොම්පාගාර සැලසුම් කිරීමත් අපේක්ෂිත ඉලක්කවලට පසුපසින් පැවතුණි.

## 3.3 කොන්ත්‍රාත් පරිපාලනය

--------------------------

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කොන්ත්‍රාත්කරු විසින් ආරක්ෂිත පියවර අනුගමනය නොකිරීම හේතුවෙන් පුද්ගලික නිවාස හිමියන්ට සිදුවූ හානි නිසා වනාතමුල්ල අපජල නාලිකා පද්ධතියේ යාවත්කාලීන කිරීම යටතේ වැඩ පසුව අතහැර දමා තිබුණි. තවද, කොන්ත්‍රාත්කරු විසින් වර ප්‍රසාද නොලත් නාගරික ජනතාවට සිදුවූ අලාභයට වන්දි ලබාදීමට හැකිවන ලෙස සර්වග්‍රාහි පදනමට රක්ෂණ ආවරණයක් ලබාගෙන නොතිබුණි. කොන්ත්‍රාත්තුව යටතේ වැඩ නතර කිරීම හේතුවෙන් කොන්ත්‍රාත්කරු විසින් සීවිලී මාවත සහ සරණපාලහිමි මාවතේ හානි වූ නිවාසවල අළුත්වැඩියා කටයුතු සිදුකර නොතිබුණි. 2017 අප්‍රේල් 15 දින වැඩ නතර කරන අවස්ථාවේදී ආරම්භක ප්‍රමාණ පත්‍රවල සඳහන් රේටයන් මත රු.මිලියන 34.19 ක් වටිනා වැඩ අසම්පූර්ණව පැවතුණි. ලැබී තිබුණු තොරතුරු වලට අනුව, පසුව නව රේටයන් මත එම වැඩ සඳහා රු.මිලියන 65.67 ක පිරිවැයකට ඉංජිනේරු ඇස්තමේන්තුව සකස් කර තිබුණි.

(ආ) ලැබී තිබුණු තොරතුරු අනුව, අදාල ප්‍රදේශ තුළ මෑතකදී සිදුකරන ලද සංවර්ධන කටයුතු හේතුවෙන් කිලෝමීටර් 10 ක අපජල නල අළුත්වැඩියාව සහ කිලෝමීටර් 125 ක අපජල නලවල තත්ත්වය තක්සේරු කිරීමේ කොන්ත්‍රාත්තුව යටතේ ප්‍රදානය කරන ලද කොන්ත්‍රාත්තුවේ කොටසක් වන කොළඹ අපජල පද්ධතියේ උතුරු ප්‍රදේශයට ජලය ලැබෙන සහ කිරුලපන සහ නාරාහේන්පිට ප්‍රදේශවල අපජල නල එලීම ඉවත් කර තිබුණි. එම නිසා, වැඩවල විෂය පථයේ අඩුවීම මත කොන්ත්‍රාත් ගිවිසුම සංශෝධනය කිරීමට ව්‍යාපෘතිය පියවර ගෙන තිබුණි.

## 3.4 නැවත පදිංචි කිරීමේ කටයුතු

----------------------------

ලැබී තිබුණු තොරතුරු අනුව, නාගරික සංවර්ධන අධිකාරියේ නැවත පදිංචි කිරීමේ සැලසුම් දියත් කිරීමේ ප්‍රමාදයන් හේතුවෙන්, ව්‍යාපෘතිය විසින් 2013 වර්ෂයේ කටයුතු ආරම්භ කළ දෙමටගොඩ ප්‍රදේශය අනවසරයෙන් රජයේ ඉඩම්වල පදිංචි පවුල් 10 ක් ඇතුළුව පවුල් 67 ක් නැවත පදිංචි කිරීම 2017 දෙසැම්බර් 31 දින විටත් අවසන් කර නොතිබුණි. තවද, ව්‍යාපෘතිය අනවසරයෙන් පදිංචි පවුල් වෙනත් ස්ථානවල නැවත පදිංචි කිරීමට රු.මිලියන 40.30 ක අමතර පිරිවැයක් ඇස්තමේන්තු කර තිබුණි. ඊට අමතරව, දෙමටගොඩ මල්ලිකාරාම මාවතේ අනවසර පදිංචිකරුවන් නැවත පදිංචි කිරීම සඳහා එකතුව රු.මිලියන 4 ක් වැය කිරීමට ව්‍යාපෘතියට සිදුවී තිබුණි.